# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1990/15 - 2016 ඔක්තෝබර් මස 26 වැනි බදාදා - 2016.10.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**මධ්‍යම පළාතේ පළාත් සභාව**

2016 අංක 01 දරන මධ්‍යම පළාත් සභාවේ බඩු උකස් ගන්නන්ගේ (සංශෝධන) ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාත් සභාව විසින් 2016.08.23 දින සම්මත කරන ලදුව 2016.09.15 වැනි දින ගරු ආණ්ඩුකාරතුමිය විසින් අනුමත කොට ඇති ඉහත ප්‍රඥප්තිය සියලුදෙනාගේ දැන ගැනීම පිණිස මෙහි පළකරමි.

සරත් ඒකනායක,<br>
මධ්‍යම පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය<br>
සහ මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය,<br>
පළාත් පාලන, මිනිස්බල, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු,<br>
සංචාරක, ඉඩම්, සමුපකාර සංවර්ධන, වෙළඳ හා වාණිජ,<br>
ආහාර සැපයුම් හා බෙදාහැරීමේ කටයුතු සහ<br>
ආයෝජන සම්බන්ධීකරණ යන විෂයයන් භාර අමාත්‍ය.

2016 ඔක්තෝබර් මස 17 වැනි දින,<br>
මහනුවර,<br>
මධ්‍යම පළාත් සභාවේ,<br>
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

**මධ්‍යම පළාත් සභාවේ 2016 අංක 01 දරන මධ්‍යම පළාත් සභාවේ**<br>
**බඩු උකස් ගන්නන්ගේ (සංශෝධන) ප්‍රඥප්තිය**

මධ්‍යම පළාතේ පළාත් සභාවේ 2014 අංක 04 දරන බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

1. මෙම ප්‍රඥප්තිය මධ්‍යම පළාතේ පළාත් සභාවේ 2016 අංක 01 දරන බඩු උකස් ගන්නන්ගේ (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, මධ්‍යම පළාතේ පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණු දිනයේ සිට බලාත්මක වන්නේ ය.

1A - PG 3192 — 09 (2016/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

22 වගන්තිය සංශෝධනය කිරීම

2. මෙහි මින්මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන 2014 අංක 04 දරන බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තියේ 22 වගන්තියේ ''එය උකස් කරන ලද දින සිට එළඹෙන මාස 24 ක්'' යන වාක්‍යාංශය ඉවත් කොට ''එය උකස් කරන ලද දින සිට එළඹෙන මාස 12 ක්'' යන වාක්‍යාංශය ආදේශ කිරීමෙන් මෙයින් එම වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

63 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 63 වන වගන්තියේ ''ලියාපදිංචි බැංකුවක්'' යන යෙදුමෙහි අර්ථ නිරූපනය වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපනය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ලියාපදිංචි බැංකුව යන්නෙන්, 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූලව බලපත්‍රලාභී බැංකුවක් අදහස්වේ.

දෙවන උප ලේඛනය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනයේ ඇතුළත් ''ඒ උකස් තුණ්ඩුව අදාළ ඔඩපනය එය උකස් කලදින සිට මාස 24 කදී බේරා ගනු නොලැබුවහොත් එම ඔඩපනය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබිය හැකිය.'' යන වාක්‍යාංශය ඉවත් කර ඒ වෙනුවට පහත වාක්‍යාංශය ආදේශ කිරීමෙන් දෙවන උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

''ඒ උකස් තුණ්ඩුව අදාළ ඔඩපනය එය උකස් කළ දින සිට මාස 12 කදී බේරාගනු නොලැබුවහොත් එම ඔඩපනය ප්‍රසිද්ධ වෙන්දේසියේදී විකුණනු ලැබේ.''

5. මේ පනතේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨය බලපැවැත්විය යුතු ය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.